**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

අදියර III විභාගය - ජූලි 2021

## (302) කළමනාකරණ ගිණුම්කරණය හා මූල්‍ය
(Management Accounting and Finance)

---

**සමස්ත විග්‍රහය:**

මෙම ප්‍රශ්න පත්‍රය ලකුණු 100 ක් ආවරණය කරමින් කොටස් 3 කින් සමන්විත විය.

1. එකකට ලකුණු 5 බැගින් ලකුණු 20 ක් සඳහා අනිවාර්ය ප්‍රශ්න 4 ක්, **A කොටසේ** ඇතුළත්ය.
2. එකකට ලකුණු 10 බැගින් ලකුණු 30 ක් සඳහා අනිවාර්ය ප්‍රශ්න 3 ක්, **B කොටසේ** ඇතුළත්ය.
3. එකකට ලකුණු 15 ක්, ලකුණු 10 ක් සහ ලකුණු 25 ක් බැගින් ලකුණු 50 ක් සඳහා වූ අනිවාර්ය ප්‍රශ්න 3 ක්, **C කොටසේ** ඇතුළත්ය.

**පොදු නිරීක්ෂණ:**

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා බහුතරයක් ශිෂ්‍යයන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොමැත. නමුත්, සමහර අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රය සඳහා හොඳින් පිළිතුරු සපයා තිබුණි.

**කොටස් අනුව කාර්යසාධනය:**

ලකුණ 20 ක් සඳහා වූ අනිවාර්ය ප්‍රශ්න 4 කින් **A කොටස** සමන්විත විය. මෙම කොටස සඳහා අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය. ප්‍රශ්න අනුව මෙම කොටසේ උත්තර ලිවීමේ කාර්යසාධනය පහත පරිදි විය:

| ප්‍රශ්න අංකය | කාර්යසාධන ඇගයීම |
|---|---|
| 1 | සතුටුදායකයි |
| 2 | සාමාන්‍යයයි |
| 3 | සාමාන්‍යයයි |
| 4 | සතුටුදායකයි |

ලකුණ 30 ක් සඳහා වූ අනිවාර්ය ප්‍රශ්න 3 කින් **B කොටස** සමන්විත විය. මෙම කොටස සඳහා ද අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය. ප්‍රශ්න අනුව මෙම කොටසේ උත්තර ලිවීමේ කාර්යසාධනය පහත පරිදි විය:

| ප්‍රශ්න අංකය | කාර්යසාධන ඇගයීම |
|---|---|
| 5 | සතුටුදායකයි |
| 6 | සතුටුදායකයි |
| 7 | සාමාන්‍යයයි |

ලකුණ 50 ක් සඳහා වූ ප්‍රශ්න 3 කින් **C කොටස** සමන්විත විය. මෙම කොටස සඳහා අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය. ප්‍රශ්න අනුව මෙම කොටසේ උත්තර ලිවීමේ කාර්යසාධනය පහත පරිදි විය:

| ප්‍රශ්න අංකය | කාර්යසාධන ඇගයීම |
|---|---|
| 8 | සාමාන්‍යයයි |
| 9 | සතුටුදායකයි |
| 10 | සාමාන්‍යයයි |

# A කොටස

## ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නයෙන් කාරක ප්‍රාග්ධන චක්‍රය හා දළ ලාභය, විකුණුම් පිරිවැය, තොග නේවාසික කාලය සහ වෙළඳ ලැබිය යුතු මුදල් කාලය ගණනය කරන ආකාරය පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබේ.

**කාර්යසාධනය:**

- මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්ය සාධනය සතුටුදායක මට්ටමක විය.
- බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට පෙළඹී තිබූ අතර හොඳින් පිළිතුරු සපයා තිබුණි.

**පොදු දුර්වලතා:**

- සමහර අයදුම්කරුවන් විකුණුම් පිරිවැය සහ දළ ලාභය වරදවා ගණනය කර තිබුණි. එම නිසා තොග නේවාසික කාලය වැරදි වූ අතර එමගින් කාරක ප්‍රාග්ධන චක්‍රයේ අවසාන පිළිතුර වැරදී ගොස් තිබුණි.
- කාරක ප්‍රාග්ධන චක්‍රය ගණනය කිරීමේදී වැදගත් සාධකයක් වන තොග පිරිවැටුම් කාලය ගණනය කිරීමේදී සාමාන්‍ය තොගය හා සාමාන්‍ය වෙළඳ ණයගැති ශේෂය, සමහර අයදුම්කරුවන් විසින් නොසලකා හැර තිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

අයදුම්කරුවන් විසින් අමතර පොත්පත් සහ ස්ව-අධ්‍යයන පොත් පෙළ පරිශීලනය කිරීමෙන් දැනුම යාවත්කාලීන කරගත යුතු අතර මෙවැනි ආකාරයේ ප්‍රශ්න පුහුණු විය යුතුය.

## ප්‍රශ්න අංක 02

දී තිබූ තොරතුරු ඇසුරින් තුලිත ලකුණු ක්‍රමයේ මූල්‍ය දෘෂ්ටිකෝණයෙන් කාර්යසාධනය මැනීමට අදාලව උදාහරණ 2ක් සහ තුලිත ලකුණු ක්‍රමයේ පාරිභෝගික දෘෂ්ටි කෝණයෙන් කාර්යසාධනය මැනීමට අදාලව එක් උදාහරණයක් හඳුනාගැනීමත් තුලිත ලකුණු ක්‍රමයේ අවාසි දෙකක් සඳහන් කිරීමෙන් මෙහිදී අවශ්‍ය විය.

**කාර්යසාධනය:**

මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමක විය.

**පොදු දුර්වලතා:**

අයදුම්කරුවන් විසින් මෙවැනි ප්‍රශ්න පෙර පුහුණුවීම් කර නොමැති බව පෙනුනි. ඉතා සුළු පිරිසක් මේ ප්‍රශ්නයට මුළු ලකුණු ලබාගෙන තිබුණි. මෙහිදී ප්‍රශ්නය තුළින්ම පිළිතුර ලබාගත හැකිව තිබුණි. සමහරු ප්‍රශ්නය නිසි පරිදි කියවීමෙන් තොරව ගණනය කිරීම් කර තිබුණි. අයදුම්කරුවන් විසින් මෙම මාතෘකාව අධ්‍යයනය කර නොතිබීම නිසා **(b) කොටසට** පිළිතුරු සැපයීම අපහසු වීම හේතුවෙන් **(b) කොටසේ** පිළිතුරු ඉතා අසතුටුදායක විය.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

- ස්ව-අධ්‍යයන පාඩම් මාලාවේ ඇති අදාල පරිච්ඡේදය නිසි ලෙස කියවිය යුතු බවට නිර්දේශ කෙරේ.
- පසුගිය විභාග ප්‍රශ්න වල ඇති මෙවැනි ආකාරයේ ප්‍රශ්න වලට පිළිතුරු සපයා පුහුණු විය යුතුය.

## ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කරන ලද්දේ ආන්තික පිරිවැය ක්‍රමය භාවිතයෙන් 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය පිළියෙළ කිරීමය.

**කාර්යයසාධනය:**

අයදුම්කරුවන්ගේ කාර්යය සාධනය සාමාන්‍ය මට්ටමක විය.

**පොදු දුර්වලතා:**

(1) මෙවැනි ආකාරයේ ප්‍රශ්න වලට පිළිතුරු ලියා පුහුණු වී නොමැති බව පෙනුනි.

(2) සමහර අයදුම්කරුවන් ආදායම් ප්‍රකාශනය වෙනුවට නම්‍ය අයවැයක් පිළයෙළ කර තිබුණි.

(3) ගණනය කිරීම් සඳහා සත්‍ය ස්ථාවර පිරිවැය වෙනුවට අයවැයගත ස්ථාවර පිරිවැය ගෙන තිබුණි.

(4) විචල්‍ය පිරිවැය ගණනය කිරීමට වැරදි නිෂ්පාදන ප්‍රමාණයන් ගෙන තිබූ අතර සමහර අයදුම්කරුවන් අවසාන තොගය නොසලකා හැර තිබුණි.

(5) බොහෝ අයදුම්කරුවන් ආන්තික පිරිවැය පදනම් කර ගනිමින් ආදායම් ප්‍රකාශය පිළියෙළ කිරීමට නොදනී.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

- ස්ව-අධ්‍යයන කාණ්ඩයන්හි මෙම මාතෘකාවට අදාල පරිච්චේදය කියවා අභ්‍යාස පුරුදු පුහුණු විය යුතුය.
- පසුගිය විභාග ප්‍රශ්න පත්‍රවල අඩංගු සමාන ආකාරයේ ප්‍රශ්න වලට පිළිතුරු ලියා, පුහුණු විය යුතුය.

## ප්‍රශ්න අංක 04

අදාල පිරිවැයකරණය භාවිතයෙන් නිෂ්පාදනය කරනවාද නැතහොත් මිලදී ගන්නවාද යන්න තීරණය කිරීම මෙහිදී පරීක්ෂාවට ලක්විය.

**කාර්යසාධනය:**

අයදුම්කරුවන්ගේ කාර්ය සාධනය සතුටුදායක මට්ටමක විය.

**පොදු දුර්වලතා:**

බහුතරය නිවැරදිව සපයා තිබුණද, සමහරු විචල්‍ය පිරිවැය මත ඉතිරිය නොසලකා හැර තිබුණි. සමහර අයදුම්කරුවන් ගතයුතු තීරණය කුමක්දැයි සඳහන් කර නොතිබුණි.

## <u>B කොටස</u>

## ප්‍රශ්න අංක 05

සීමාකාරී සාධක හඳුනාගැනීම සහ ප්‍රශස්ත නිෂ්පාදන මිශ්‍රය ගණනය කිරීම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබුණි.

**කාර්යසාධනය:**

මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ කාර්ය සාධනය සතුටුදායක මට්ටමක විය.

**පොදු දුර්වලතා**

(1) **(a) කොටසින්** සීමාකාරී සාධක හඳුනා ගැනීම අවශ්‍ය වුවද, බොහෝ අපේක්ෂකයින් CD අමුද්‍රව්‍ය සීමාකාරී සාධකය ලෙස හඳුනාගෙන තිබුණ ද පුහුණු ශ්‍රමය සීමාකාරී සාධකයක් ද නැද්ද යන්න හඳුනාගෙන නොතිබුණි. එම නිසා ගණනය කිරීම් නිසි පරිදි නොදැක්වීම නිසා ඔවුනට ලකුණු අහිමි විය.

(2) දායකත්වය ගණනය කිරීමේදී විචල්‍ය නිෂ්පාදන පොදු කාර්ය, විචල්‍ය පිරිවැයක් ලෙස සැලකිල්ලට ගෙන නොතිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

- පසුගිය විභාග ප්‍රශ්න වලට පිළිතුරු ලියා පුහුණු වන්න.
- ස්ව-අධ්‍යාන පාඩම් වල ඇති අභ්‍යාස කරන්න.

## ප්‍රශ්න අංක 06

2022 ජනවාරි, පෙබරවාරි සහ මාර්තු යන මාස සඳහා මුදල් අයවැය පිළියෙළ කිරීම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කෙරිණි.

**කාර්යසාධනය:**

අපේක්ෂකයින්ගේ කාර්ය සාධනය සතුටුදායක මට්ටමක විය.

**පොදු දුර්වලතා:**

(1) මුදල් ප්‍රවාහ සඳහා ආකෘතිය අනුගමනය කර නොතිබුණි. සමහරු ආදායම්, දළ ලාභය සහ සහ ශුද්ධ ලාභය පෙන්වමින් ආදායම් ප්‍රකාශයක් ලෙස මුදල් අයවැය පිළියෙළ කර තිබුණි. මුදල් අයවැයක ඇතුළත් විය යුත්තේ මුදල් ලැබීම් සහ මුදල් ගෙවීම් පමණි. උපචිත ගෙවීම් කිසිවක් මුදල් අයවැයකට ඇතුළත් වන්නේ නැත.

(2) සමහර අයදුම්කරුවන් රුපියල් මිලියනයක අවම මුදල් ශේෂය පවත්වා ගැනීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීමට අපොහොසත්ව තිබූ අතර, එනිසා ණය අවශ්‍යතාවය හා පොලිය නිවැරදිව හඳුනාගෙන නොතිබුණි.

(3) බොහෝ අපේක්ෂකයන් අත්පිට විකුණුම් වලින් වට්ටම් අඩුකර නොතිබුණි. විකුණුම් වලින් ලැබීම්, සැපයුම්කරුවන්ට ගෙවීම් නිවැරදිව ගණනය කර නොතිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

- නිවැරදිව ප්‍රශ්නය කියවන්න.
- පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු ලියා පුහුණු වන්න.
- ස්ව-අධ්‍යන පාඩම් මාලා අධ්‍යයනය කරන්න.

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නයෙන් සාමාන්‍ය කොටස් පිරිවැය, නිදහස් කළ නොහැකි වරණීය කොටස් පිරිවැය, නිදහස් කළ හැකි වරණීය කොටස් පිරිවැය, සහ බරතැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පරිවැය ගණනය කරන ආකාරය පරීක්ෂා කර තිබුණි.

**කාර්යසාධනය:**

අපේක්ෂකයන්ගේ කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමක විය.

**පොදු දුර්වලතා:**

(1) බොහෝ අයදුම්කරුවන්, පිරිවැය ගණනය කිරීම සඳහා නිවැරදි සූත්‍ර භාවිතා කර නොතිබුණි.

(2) බරතැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය ගණනය කිරීමේදී සමහර අපේක්ෂකයින් වෙළඳපල අගයන් වෙනුවට පොත් අගයන් ගෙන තිබුණි.

(3) නිදහස් කළ හැකි ණයකර පිරිවැය හා බරතැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය සඳහා බහුතරයක් අයදුම්කරුවන්ගේ පිළිතුරු වැරදි විය.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

- පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර පුහුණු වන්න. සමාන ආකාරයේ ප්‍රශ්න පසුගිය විභාගවලදී පරීක්ෂා කර ඇති බැවින් පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර බලන්න.
- ස්කන්ධ පිරිවැය, ණය පිරිවැය හා බරතැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය සඳහා සූත්‍රයන් නිවැරදිව දැනගන්න.

## <u>C කොටස</u>

### ප්‍රශ්න අංක **08**

මෙම ප්‍රශ්නයෙන් ඍජු ද්‍රව්‍ය මිල විචලනය, ඍජු ද්‍රව්‍ය මිශ්‍රණ විචලනය හා ඍජු ද්‍රව්‍ය ඵලදා විචලනය ගණනය කිරීම පරීක්ෂාවට ලක් කළ අතර **(b) කොටසින්** අයවැයගත දායකය, සත්‍ය දායකය සමග සැසඳීම සඳහා මෙහෙයුම් ප්‍රකාශයක් පිළියෙළ කිරීම අපේක්ෂා කෙරිණි.

**කාර්යසාධනය:**

සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.

**පොදු දුර්වලතා:**

(1) බොහෝ අයදුම්කරුවන් ඍජු ද්‍රව්‍ය මිල විචලනය නිවැරදිව ගණනය කර ඒ සඳහා මුළු ලකුණු ලබාගෙන තිබුණි. නමුත් ඍජු ද්‍රව්‍ය මිශ්‍රණ විචලනය හා ඍජු ද්‍රව්‍ය ඵලදා විචලනය ගණනය කිරීම ඔවුනට අපහසු වී තිබුණි.

(2) මෙහෙයුම් ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී බහුතරයක් අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රයේ දී තිබූ විචලනයන් පෙන්වීමෙන් සුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්හ.

(3) මිශ්‍රණ හා ඵලදා විචලනය ගණනය කිරීමේ පුහුණුවක් නොමැති බව නිරීක්ෂණය විය.

(4) මෙහෙයුම් ප්‍රකාශනය පිළියෙළ කිරීමේ හා ඉදිරිපත් කිරීමේ ද පුහුණුවක් නොමැති බව පැහැදිලි විය.

(5) සමහර අයදුම්කරුවන්, විචලතාවන් වාසිදායකද අවාසිදායකද යන්න පෙන්වා නොතිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

මෙම විෂය ක්ෂේත්‍රයට අදාළ පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර කරන්න.

## ප්‍රශ්න අංක 09

ශුද්ධ වර්තමාන අගය භාවිතා කරමින් ආයෝජන තීරණ ගන්නේ කෙසේද යන්න මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාවට ලක් කර තිබුණි.

**කාර්යසාධනය:**

මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.

**පොදු දුර්වලතා:**

(1) සමහර අයදුම්කරුවන් වසර 4 ක් වෙනුවට සම්පූර්ණ අවුරුදු 5 සඳහාම ප්‍රාග්ධන දීමනා සැලකිල්ලට ගෙන තිබුණි.

(2) බහුතරයක් අයදුම්කරුවන් ආදායම් බදු ගෙවීම වැරදියට ගණනය කර තිබූ අතර, ක්ෂය සහ ප්‍රාග්ධන දීමනා ගලපමින් බදු වගකීම ගණනය කිරීමට සිසුන් නොදන්නා බව පැහැදිලි විය. සමහර අයදුම්කරුවන් නඩත්තු වියදම ඉඩ නොදෙන වියදමක් ලෙස ගලපා තිබුණි.

(3) ගණනය කිරීම් දෝෂ රාශියක් දැකිය හැකි විය.

(4) සමහර අයදුම්කරුවන් යන්ත්‍රය මිලදී ගත් අවස්ථාවේ ගෙවන ලද නඩත්තු පිරිවැය අදාළ කරන ආකාරය නිවැරදිව අවබෝධ කරගෙන නොතිබුණි. සමහරු නඩත්තු පිරිවැය වසර පහ පුරා බෙදා හැර තිබුණි.

(5) සමහර අයදුම්කරුවන් ස්ථාවර පිරිවැය වරදවා ගණනය කර තිබුණි.

(6) සමහරු ශුද්ධ වර්තමාන අගය ගණනය කර තිබුණද තීරණය සඳහන් කර නොතිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

- පසුගිය විභාග ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලියා පුහුණු වන්න.
- සියලු පෙරවැඩ පෙන්වීමට අයදුම්කරුවන් උනන්දු විය යුතුය.
- ගණනය කිරීම් දෝෂ වලක්වා ගත යුතුය.

## ප්‍රශ්න අංක 10

මෙම ප්‍රශ්නයේ පෙරසැරි පිරිවැය සම්බන්ධවද, **(b) කොටසින්** සමාගමක සමච්ඡේදක විකුණුම් වටිනාකම හා ඒකාබද්ධ ලාභ පරිමා අනුපාතය ගණනය කිරීමට පරීක්ෂාවට ලක් කෙරිණි.

**කාර්යසාධනය:**

කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමක විය.

**පොදු දුර්වලතා:**

(1) සමහර අයදුම්කරුවන් සමානුපාතික ඒකක සහ පිරිවැය ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී විශේෂයෙන් අවසාන නොනිමි වැඩ සඳහා සමානුපාතික ඒකක ගණන ගණනයේ දී අඩු ලකුණු ලබාගෙන තිබුණි.

(2) සමහර අයදුම්කරුවන් සාමාන්‍ය අපතයේ සුන්බුන් අගය සැලකිල්ලට ගෙන තිබුණි.

(3) තවත් සමහර අයදුම්කරුවන් අසාමාන්‍ය ලාභයේ සමානුපාතික ඒකක ගණන ප්‍රකාශනයට ගෙන නොතිබූ අතර සාමාන්‍ය අපතයේ සුන්බුන් අගය ප්‍රකාශනයට ගෙන තිබුණි.

(4) සමච්ඡේදක විකුණුම් වටිනාකම සහ ලාභ පරිමාව ගණනය කිරීමේදී සිසුන් විසින් පෙන්නුම් කරන ලද ව්‍යාකූලත්වය නිසා **(b) කොටසේ** කාර්යසාධනය මුළුමනින්ම අසතුටුදායකය. සම්ච්ඡේදක විකුණුම් වටිනාකම ගණනය කිරීමේදී මුළු ස්ථාවර පිරිවැය සැලකිල්ලට ගෙන නොතිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

- ආදර්ශ ප්‍රශ්න පත්‍රය ඇතුළුව පසුගිය විභාග ප්‍රශ්න වලට පිළිතුරු ලියා පුහුණු වන්න.
- ස්ව අධ්‍යයන පාඩම් මාලා අධ්‍යයනය කරන්න.

\- - -

**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**

1. නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිප වතාවක් මනා අවධානයකින් කියවිය යුතු අතර, අවශ්‍ය තැන්වලදී පෙරවැඩ පැහැදිලිව පෙන්විය යුතුය.

3. ප්‍රශ්න වලට උත්තර සැපයීමේදී උපකල්පනයන් කර ඇත්නම් ඒවා පැහැදිලිව පෙන්විය යුතුය.

4. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

5. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

6. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා යෝජිත උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය. සමාන රටාවන්ගෙන් හා ව්‍යුහයන්ගෙන් යුත් ප්‍රශ්න නැවත නැවත විභාගයන්හිදී පරීක්ෂා කළ හැකි බැවින් මෙම ක්‍රමය අනුගමනය කිරීම වාසිදායකය.

7. ස්ව-අධ්‍යයන පාඩම්මාලා අධ්‍යයනය කිරීම හා එහි ඇති උත්තර පරිශීලනය කිරීම ඉතා වැදගත්ය.

8. මෙම විෂය සම්බන්ධව ඇති පොත්පත්, සඟරා හා ලිපි ආදිය පරිශීලනය කළ යුතුය.

9. විභාගයේදී කාලය මනාව කළමනාකරණය කර ගැනීම. එක් එක් ප්‍රශ්නයට වෙන්කර ඇති ලකුණු මගින් ඒ සඳහා වෙන්කළ යුතු කාලය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය.

10. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * -